*සැ. යු.*-2011.08.05 දින පළ වූ අංක 1,718 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,719 - 2011 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2011.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1196 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1199 |


*සැ. යු.*—කාසිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011, ජූලි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1193- B 80249— 8,885 (2011/08)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 26 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | හික්කඩුව | දොඩන්දූව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-321

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 26 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | නිකවැරටිය | මාගුල් ඕතොට කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වන්නිහත් පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම්, කාර්යාලය, කුරුණෑගල. |

08-322

### මැතිවරණ දෙපාර්තමේන්තුව

### කාර්යාල සේවක සේවයේ III පන්තියේ කාර්යාල කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීම - 2011

මෙම දෙපාර්තමේන්තුවේ පවත්නා කාර්යාල සේවක සේවයේ III වැනි පන්තියේ තනතුරු පුරප්පාඩු 20 ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ම විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2011.08.31 වැනි දින වේ.

02. *සුදුසුකම් :*

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් 06 කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත් වී තිබිය යුතුය. සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය සමත්වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
(ii) දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
(iii) පිරිමි අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

03. *වැටුප් ක්‍රමය.*—PL-1- 2006A රා. ප. ච. ලේඛ. 6/2006 (iv) අනුව, රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 ක මාසික වැටුප් පරිමාණයක් මෙම තනතුරුට හිමි වේ.

04. *වයස් සීමාව :*
ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 වැඩි විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. *සේවයේ නියුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් විය යුතුය.
(iii) පත් වූ දින සිට වසර තුනක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉමකි.
(iv) *ගැසට් පත්‍රයේ* ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු වලට පත්කිරීමේ දී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.
(v) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව පත්වීමේ දින සිට වසර පහක් තුළ සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අමතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.*- අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීතීන්හි පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි, අංක 1258/20 හා 2002.10.18 දිනැති කාර්යාල සේවක සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුව අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක් කරනු ලැබේ.

*06. 01 සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම :*

(i) අධ්‍යාපන සුදුසුකම් සඳහා (උපරිම ලකුණු ප්‍රමාණය 100),
(ii) මැතිවරණ දෙපාර්තමේන්තුවේ අනියම් සේවය සඳහා (සේවා කාලය පදනම් කර ගනිමින් උපරිම ලකුණු ප්‍රමාණය 50 කි),
(iii) විශේෂ සුදුසුකම් සඳහා ලකුණු 50 යි - අනු පිටපත්, ඡායා පිටපත් ගැනීම, කොළ තේරීම, පොත් බැඳීම, ගබඩා කටයුතු හා ඡන්ද පෙට්ටි සම්බන්ධ කටයුතු ආදී වශයෙනි.

06.02 සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපි ලෙස සුදුස්සන් තෝරා ගනු ලැබේ.

07. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(අ) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (A4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින්ම සකස් කර සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් 2011.08.31 වැනි දිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් "මැතිවරණ කොමසාරිස්, මැතිවරණ මහ ලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය, 10107" යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "කා. සේ. සේ. III පන්තියේ කාර්යාල කම්කරු තනතුරුට බඳවා ගැනීම - 2011" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ආ) තැපෑලේ දී අස්ථානගත වන ඉල්ලුම්පත් පිළිබඳ වගකියනු නොලැබේ.

(ඇ) පහත සඳහන් ලිපි ලේඛනවල ඡායා පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත. :

i. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක පිටපත් (මින් එක් සහතිකයක් අයදුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.),
ii. උප්පැන්න සහතිකයේ පිටපතක්,
iii. අ.පො.ස. (සා.පෙළ) සහතිකයේ පිටපතක්,
iv. මැතිවරණ දෙපාර්තමේන්තුවේ අනියම් සේවා කාලයන්ට අදාළ පත්වීම් ලිපිවල පිටපත්,
v. වෙනත් අධ්‍යාපනික සහතික පිටපත් (ඇත්නම් පමණක්),
vi. පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් (ඇත්නම් පමණි).

(ඈ) ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

(ඉ) අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සාමදාන විනිශ්චය-කාරවරයෙකු විසින් හෝ රජයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියෙකු විසින් හෝ තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සහතික කරනු ලැබිය යුතුය.

09. *අයදුම්කරුගේ අනන්‍යතාව.*- සම්මුඛ පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු විසින් තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ලැබේ. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියැදුරු බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහු තෝරා ගැනීමට පසුව හෙළිවුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

11. අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව මැතිවරණ කොමසාරිස් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2011 ජූලි මස 29 වැනි දින,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යාල සේවක සේවයේ III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම :————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. (අ) ලිපිනය :————.
(ආ) පදිංචි දිස්ත්‍රික්කය :————.

03. (අ) උපන් දිනය :
වර්ෂය :————, මාසය :————, දිනය :————.

(ආ) ........... දිනට වයස :
අවුරුදු :————, මාස :————, දින :————.

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. (අ) ශ්‍රී ලාංකිකයෙක් ද යන වග :————.
(ආ) විවාහක/අවිවාහක බව :————.

05. (අ) අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. (සා.පෙළ) :
වර්ෂය :————. මාසය :————.
විභාග අංකය :————.

| *විෂය* | *ප්‍රතිඵල* | *විෂය* | *ප්‍රතිඵල* |
|---|---|---|---|
| 1. .............. | ......... | 1. .............. | ......... |
| 2. .............. | ......... | 2. .............. | ......... |
| 3. .............. | ......... | 3. .............. | ......... |
| 4. .............. | ......... | 4. .............. | ......... |

(ආ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ සේවය කළ අනියම් සේවා කාලයන්ට අදාළ විස්තර :

| *කාලසීමාව* | *සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නම* | *අදාළ පත්වීම් ලිපිවල යොමු අංකය හා දිනය* |
|---|---|---|
| 1. .............. | .............. | .............. |
| 2. .............. | .............. | .............. |
| 3. .............. | .............. | .............. |
| 4. .............. | .............. | .............. |
| 5. .............. | .............. | .............. |

06. උසස් අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (ඇත්නම් පමණි) :————.

07. පළපුරුද්ද (ඇත්නම් පමණක් විස්තර සඳහන් කරන්න) :————.

08. ඔබ සේවය කිරීමට වඩාත් කැමති දිස්ත්‍රික්කය/දිස්ත්‍රික්ක අනු පිළිවෙලින් :

(i) ————.
(ii) ————.
(iii) ————.

*අයදුම්කරුගේ සහතිකය*

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හා වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මාගේ අයදුම්පත්‍රය අවලංගු වීමට යටත් වන බවත්, තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ නමැති අය මා පුද්ගලිකව දන්නා බවත්, ඔහු අද දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

08-232

---

**අධිකරණ අමාත්‍යාංශය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1705 හා 2011 මැයි මස 06 වැනි සිකුරාදා (2011.05.06) දිනැති *ගැසට් නිවේදනය* මඟින් ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලදී. එම නිවේදනයේ 02 හා 03 ඡේදයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඉහත නිවේදනයේ,

02 *වගන්තියේ* - "………අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය "2011.05.31" යන්න "අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය "2011.09.09 වැනි දිනට හෝ ඊට පෙර" ලෙස සංශෝධනය කරනු ලැබේ.

03 *වගන්තියේ* - "……… මෙම තනතුර වයස අවුරුදු 65 වන තෙක් වලංගු වන පරිදි දෙනු ලබන අතර, අදාළ නිර්දේශයන් සහ වෛද්‍ය සහතික ලබාගැනීමෙන් පසු ඒ අනුව වයස අවුරුදු 70 දක්වා දීර්ඝ කරනු ලැබිය හැකිය" යන්න "මෙම තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහකට බලපවත්නා පරිදි පත් කරනු ලබන අතර, ඉන්පසුව අදාළ නිර්දේශයන් සහ වෛද්‍ය සහතික සලකා බැලීමෙන් පසුව සෑම වසර පහකට වරක් දීර්ඝ කරනු ලැබිය හැකිය. එහෙත් එම තනතුර දැරීමේ උපරිම වයස් සීමාව අවුරුදු 70 නොඉක්මවිය යුතුය." ලෙස සංශෝධනය කරනු ලැබේ.

සුහද කේ. ගමලත්,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2011 ජූලි මස 28 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

08-369

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2011**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය :*

2011 සැප්තැම්බර් මාසයේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව පර්යේෂණ සහකාර සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. :

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්‍ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතුය.

(iv) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය :*

MN - 3 - 2006A - පර්යේෂණ සහකාර සේවයේ II "ආ" ශ්‍රේණියේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු.27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික).

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - රු.17,165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමි වේ.

II 'ආ' ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව :*

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම් :*

ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලයක් විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*සහ*

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 3කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවරක සමත් වීම;

*සහ*

භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*හෝ*

ඒ හා සමාන විභාගයකින් සමත් වීම.

*සටහන.*—ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ඩිප්ලෝමාවක් ලබාගත් අය එම විශ්වවිද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාල පදනම් පාඨමාලාව සමත් වී ඇත්නම් අ. පො. ස. (සා. පෙළ) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*—මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතුය.

පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. *විභාගය* :

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300කි.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කරගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(v) *විභාග විෂයයන්* : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.:-
1. බුද්ධි පරීක්ෂණය,
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

(vi) *විෂය නිර්දේශය* :

(අ) *බුද්ධි පරීක්ෂණය* : කාලය පැය 1යි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* : කාලය පැය 1යි. මුළු ලකුණු 100 යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි:-

(i) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව;

(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම:
ව්‍යාධි වේද
පරපෝෂිත වේද
ක්ෂුද්‍ර ජීව වේද
මස්තු වේද
පෝෂණ ;

(iii) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම :-
භෞතික පරීක්ෂණ
රසායනික පරීක්ෂණ
සංවේදතා පරීක්ෂණ

(iv) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය ;

(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය ;

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2011 අගෝස්තු මස 30 වැනි දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ පර්යේෂණ සහකාර "තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*—රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(i) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය :

(*i*) අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම :—————.

(*ii*) ලිපිනය :—————.

(*iii*) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :—————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,
(iii) සත්ව පාලන ඩිප්ලෝමා සහතිකය.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (විභාග දිනට අවුරුදු 3 කට කලින් නිකුත් කරන ලද).

*සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේ ය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (II "අ") ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මඟින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (*වැ. අා.*)

2011 ජුනි මස 25 වැනි දින,
පේරාදෙණිය,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දී ය.

පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

***සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව***

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| | |
|---|---|
| *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය* | |

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (*උදා*: SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ලිපිනය :

2.1 පෞද්ගලික :————.

2.2 රාජකාරී ලිපිනය :————.

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

3.1 ස්ත්‍රී ☐
පුරුෂ ☐

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 විවාහක අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)

විවාහක ☐
අවිවාහක ☐

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 (අ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

4.4 සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්):-

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.

මුදල් ඇණවුම් අංකය :————.

| |
|---|
| *සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට. ගෙවන කාර්යාලය : පේරාදෙණිය.* *කුවිතාන්සිය මෙහි අලවන්න.* |

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

08-357

---

## සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
## ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලයට ඇතුලත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2011

**2011/2013 අධ්‍යයන වර්ෂය සඳහා සත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව**

සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේතුව මගින් පවත්වනු ලබන දෑවුරුදු සත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාවේ 2011/2013 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, සිංහල හා දෙමළ මාධ්‍ය වලින් 2011 සැප්තැම්බර් මස මහනුවර දී පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. *දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව :*

2.1 මෙම පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

2.2 මෙම පුහුණුව හුදෙක්ම වෘත්තිමය සුදුසුකම් ලබා දීමක් පමණක් වේ. (රජයේ රැකියාවක් ලබා ගැනීම සඳහා මෙම වෘත්තිය සුදුසුකමට අමතරව, එම තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ)

2.3 පාඨමාලාව හදාරන කාලය තුළදී සිසුන්ට දෛනික නේවාසික දීමනාවක් ලබා දෙන අතර, අමතරව අවශ්‍ය වන මුදල් සිසුන් විසින් සපයා ගත යුතුය.

2.4 සෙනසුරාදා හා ඉරිදා යන දින වල ද සමහර විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාර වලින් බැහැරව යවන්නේ මසකට එක් සතිඅන්තයක දී පමණි.

03. *ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථයන් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සහිතව අ.පො.ස. (සා. පෙ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් වත් සමත් වී තිබීම.;

සහ

අ.පො.ස. (උසස් පෙළ), ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් තුනක් එක්වර සමත් වී තිබීම (මෙම සුදුසුකම ඇති සිසුන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.);

හෝ

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත්, සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබීම;

සහ

අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වී තිබීම. මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ 3.1 (අ) හි අයදුම්කරුවන් සියළුම දෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි.

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ.පො. ස. (සා.පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර, අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සමත් වී තිබිය යුතු ය.

3.2 2011.09.15 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවු. 17 ට නොඅඩු විය යුතු අතර, අවු 25 ට වැඩි නොවිය යුතුය.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් සැලැකිලිමත්ව කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැරවන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවන් අයදුම්පත් එවීම නොකළ යුතු ය. රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දෑවුරුදු සත්ත්ව පාලන පාඨමාලාවක් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 සිංහල/දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීමේ විභාගයට පෙනී සිටිය යුත්තේ ද තමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යයෙනි.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙහි 5.2 යටතේ සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකට අමතරව ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

*04. අයදුම්පත් :-*

4.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත පිළියෙල කර ගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 විභාග ගාස්තුව රු. 150 කි. අපේක්ෂකයා විසින් තැපැල් කාර්යාලයකින් ලබා ගත් රු. 150 ක මුදල් ඇණවුමක් "සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්" නමින් ලබා ගෙන මාරු කරගන්නා තැපැල් කාර්යාලය, "පේරාදෙණිය" වශයෙන් සඳහන් කර අයදුම්පත්‍රයක් සමග අදාළ ස්ථානයේ දාරය පමණක් ඇලවිය යුතු ය. තව ද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වන මුදල් ඇණවුම අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2011.09.15 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, .තැ.පෙ. 13, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතු ය.

4.4 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2011/2013 සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම" යන්න සඳහන් කරන්න.

4.5 අයදුම්පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය. ඉල්ලා ඇති සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*05. බඳවා ගැනීම :-*

5.1 පුහුණුවන්නන් තෝරා ගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5.2 ලිඛිත පරීක්ෂණය සඳහා වූ විෂයය නිර්දේශය පහත සඳහන් වේ. :-

(i) *සත්ත්ව පාලනය.*—අ.පො.ස. (සාමාන්‍ය පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස් කරන බහු වර්ණ කෙටි ප්‍රශ්න අඩංගු වේ.

(ii) සාමාන්‍ය දැනීම

5.2.1 ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශය ඇසුරින් සකස් කෙරේ.

5.3 ලිඛිත විභාගය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම/හෝ පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මගින් ගෙවනු නොලැබේ.

5.4 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

වෛද්‍ය ඩබ්ලිව්. කේ. ද සිල්වා,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ. ආ.)

2011 ජූලි මස 26 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

ඉල්ලුම් පත්‍රය

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය
සත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව
(2011/2013)

විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය : | | | |

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමග නම :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. ලිපිනය :————.
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
දිස්ත්‍රික්කය :————.

06. උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :—————.

07. 2011.09.15 වැනි දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

08. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :————.

09. (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09. | | | |
| 10. | | | |

(ii) අ.පො.ස. (උසස් පෙළ) :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.)

10. මුදල් ගෙවූ තැපැල් කාර්යාලය හා මුදල් කුවිතාන්සි අංකය (මුදල් ඇණවුම ගලවා ගත හැකිවන පරිදි අමුණන්න.)

11. අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසල්/ආයතන :————.

12. පාසලෙන්/ආයතනයෙන් අස්වූ දිනය :————.

13. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)

14. ග්‍රාම සංවර්ධන/කෘෂිකාර්මික/සමාජ සේවා/ක්‍රීඩා පිළිබඳ පළපුරුද්ද :————. (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

15. අයදුම්කරු පිළිබඳ විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

1. ————.
2. ————.

ඉහත දැක්වෙන විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍යවූද, නිවැරදිවූ ද, තොරතුරු බව මගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරුක් හෙළිදරව් වුවහොත්, මගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බවද, පුහුණුව ලබන කාලයේදී මා වෙනුවෙන් රජයට යම් මුදලක් ද සිදුවීනම්, එම මුදල ගෙවීමටද මම බැඳී සිටින බවද දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

සටහන : මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන :

1. ————.
2. ————.

08-338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.